පොදු චක්‍රලේඛ අංක: 01-15/2009

මගේ අංකය : NCD/01/2007
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
කොළඹ 10.
2009.05.13 දින.

09 JUN 2009

සියලු ම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් රෝහල්වල වෛද්‍ය අධිකාරීවරුන් සහ
ආයතන ප්‍රධානීන් වෙත.

## ලෝක දුම්වැටි විරෝධී දිනය - 2009
## දුම්වැටි භාවිතයේ සෞඛ්‍යමය හානිය, ඇසුරුම්ගත පැකට්ටුවේ බාහිර නිමාව තුළින් ම දෘශ්‍යමාන විමට සැලැස්වීම

වර්ෂ 2009 මැයි මස 31 වැනිදාට යෙදී ඇති ලෝක දුම්වැටි දිනයේ මෙවර තේමාව වනුයේ **"දුම්වැටි භාවිතයේ සෞඛ්‍යමය හානිය, ඇසුරුම්ගත පැකට්ටුවේ බාහිර නිමාව තුළින්ම දෘශ්‍යමානවිමට සැලැස්වීම"** යන්න යි. අපේ දූ දරුවන්ට සෞඛ්‍ය සම්පන්න අනාගතයක් උදා කරලීම අපේ අමාත්‍යාංශයේ බැරෑරුම් වගකීම යි. ඔවුන් තුළ සිය සෞඛ්‍ය පිළිබඳ යහපත් ආකල්ප වර්ධනය කිරීමට අනුබල දීම අපේ කාර්යභාරයේ එක් වැදගත් අංගයකි. මේ කටයුත්ත ඉෂ්ඨ සිද්ධ කිරීමට ලෝක දුම්වැටි විරෝධී දිනය අතිශය උචිත අවස්ථාවකි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය මාග්‍රෙට් චාන් ෆුන් ෆු-චුන් මහත්මිය මැතක දී අවධාරණය කළ කරුණක් වේ. එනම් වර්තමාන මිනිස් සංහතිය මරණයට පත් කරවන ප්‍රධාන රෝග අටෙන් (08) න් හයකට (06) ම තීරණාත්මක හේතු කාරකයක් වන්නේ දුම්කොළ භාවිතය යන්න යි. මේ සංසිද්ධිය ශ්‍රී ලංකාවාසී ජනතාවට ද අදාළ වන්නේ ය. එහෙයින් ලෝක දුම්කොළ විරෝධී දිනයේ දී දුම්කොළ භාවිතයේ ඛේදනීය සෞඛ්‍යමය හානිය පිළිබඳ පොදු ජනයා දැනුම්වත් කිරීම සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ පිළිබඳ අමාත්‍යාංශයේ පරම වගකීමක් ලෙස අප විසින් සැලකිය යුතු ය. එසේ කිරීම අපේ අමාත්‍යාංශයේ ප්‍රමුඛ ප්‍රතිපත්තියක් ද වන්නේ ය. ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර දැනට මත් ගෙන තිබේ. ඉන් එක් වැදගත් පියවරක් වූයේ වර්ෂ 2006 දී පාර්ලිමේන්තුව ඒකච්ඡන්දයෙන් සම්මත කරගත් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යි. ඒ පනත දැන් ක්‍රියාත්මක වන්නේ ය. දළ වශයෙන් කියතොත් ඒ පනතට අනුව,

1. අවුරුදු 21ට අඩු තැනැත්තන්ට දුම්කොළ නිෂ්පාදන අලෙවි කිරීම සපුරා තහනම් ය.
2. පොදු ස්ථානයන්හි දුම්බීම තහනම් ය.
3. දුම්කොළ ප්‍රචාරණය තහනම් ය.
4. විවිධ උත්සව සඳහා දුම්කොළ කර්මාන්තයෙන් අනුග්‍රහ ලැබීම තහනම් ය.

යථෝක්ත පනත ක්‍රියාත්මක වීම මඟින් අප රටේ දුම්කොළ භාවිතය සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව කිය යුතු ව ඇත. මේ ජයග්‍රහණය වඩාත් ඵලදායී හා ශක්තිමත් කරගැනීම උදෙසා අදාළ සියලු ම පාර්ශ්වයන්ගේ සක්‍රිය සහභාගීත්වය ලබාගෙන වර්ෂය පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් මාලාවක් මේ වසරේ ලෝක දුම්වැටි විරෝධී දිනයේ ආරම්භ කරන ලෙස මෙම චක්‍රලේඛය මඟින් උදක් ම ඉල්ලා සිටිමි. පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ මැනවි.

1. ලෝක දුම්වැටි දිනයේ තේමාව, එහි වැදගත්කම එමෙන් ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අපගේ වගකීම හා ඉටු කළ හැකි කාර්යයන් පිළිබඳ සියලු කාර්ය මණ්ඩල දැනුවත් කිරීම
2. ඒ සඳහා උචිත දැනුම්වත් කිරීමේ උපකරණ සැකසීම (අත්පත්‍රිකා/බැනර්,සෞඛ්‍ය පණිවුඩ ආදිය)
3. අදාළ අවදානම් සහිත කණ්ඩායම්/ ස්ථාන ඉලක්ක කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මට්ටමෙන් අවම වශයෙන් එක් වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය.)
4. දැනට ක්‍රියාත්මක වන වර්ෂ 2006 අංක 27 දරන පනතෙන් බලපවත්නා නීතිමය පියවර නිසි ලෙස ක්‍රියාත්මක වන්නේදැ යි සොයා බැලීමට අවශ්‍ය පියවර ගැනීම
5. මේ වසරේ ලෝක දුම්වැටි දිනය සැමරීම උදෙසා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ඔබ ආයතනයේ/ ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලැබූ කාර්යයන් පිළිබඳ වාර්තාවක් 2009 ජූනි මස 30 දින වන විට මෙම අමාත්‍යාංශයේ බෝනොවන රෝග අංශයේ අධ්‍යක්ෂ වෙත යොමු කරන මෙන් ඉල්ලමි.

(වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ )
සෞඛ්‍ය ලේකම්

ලේකම්
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.